සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 ජූලි/12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level) Grade 12 Third Term Test 2018 July**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

| 45 | S | I |
|---|---|---|

කාලය: පැය දෙකයි
**02 hours**

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

(1) ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වනවිට භාරතීය සමාජයේ ආධිපත්‍යය පතුරුවාගෙන සිටියේ බ්‍රාහ්මණයන්ය. ඔවුන් විසින් ඒ සඳහා වර්ණ ධර්ම නමින් පන්ති භේදයක් හඳුන්වා දී තිබුණි. එම වර්ණ ධර්ම අනුපිළිවෙළ වූයේ,
(1) ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර (2) වෛශ්‍ය, බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, ශුද්‍ර (3) ශුද්‍ර, වෛශ්‍ය, බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය
(4) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර (5) බ්‍රාහ්මණ, වෛශ්‍ය, ක්ෂත්‍රිය, ශුද්‍ර

02. පාරම්පරික රැකී රක්ෂා ක්‍රමය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා බමුණු පූජකවරු විසින් ස්වධර්ම සංකල්පය සමාජ ගත කරන ලදී. ඒ අනුව කෘෂිකර්මාන්තය පවරන ලද්දේ
(1) බ්‍රාහ්මණයන්ටය (2) ක්ෂත්‍රියයන්ටය (3) වෛශ්‍යයන්ටය
(4) ශුද්‍රයන්ටය (5) නේසාදයන්ටය

03. වෛදික සාහිත්‍යයේ සඳහන් වන්නේ මහා බ්‍රහ්මයා විසින් මනුෂ්‍ය වර්ගය මවන ලද බවයි. චතුර්වර්ණය නිර්මාණය කිරීමේ පදනම ලෙස භගවත් ගීතාවේ සඳහන්ව ඇත්තේ,
(1) උච්ඡේදවාදයයි (2) ගුණ කර්ම විභාගයයි (3) නියති වාදයයි
(4) නිර්මාණවාදයයි (5) හේතුඵල වාදයයි

04. ශාක හා සත්ත්ව ජීවිත සම්බන්ධයෙන් විවිධ වර්ග හා ප්‍රභේද දැකිය හැකි බව පිළිගන්නා බුදු සමය මිනිස් ප්‍රජාව එකම වර්ගයක් බව ප්‍රකාශ කරයි. ඒ අනුව මිනිසුන් අතර කුල භේදයක් ඇති කිරීම නිරර්ථක ක්‍රියාවක් බව වාසෙට්ඨ සූත්‍රයෙහි සඳහන් කරන්නේ,
(1) ඓතිහාසික සාධක අනුවයි
(2) මනෝ විද්‍යාත්මක සාධක අනුවය
(3) ජීව විද්‍යාත්මක සාධක අනුවය
(4) සමාජ විද්‍යාත්මක සාධක අනුවය
(5) ආචාර විද්‍යාත්මක සාධක අනුවය

05. භාරතීය සමාජය තුළ බ්‍රාහ්මණ මතවාදයන් ව්‍යාප්ත කිරීමෙහිලා ප්‍රමුඛතම ඉගැන්වීමක් ලෙස යොදාගෙන ඇත්තේ,
(1) නිර්මාණවාදයයි (2) උච්ඡේදවාදයයි (3) ශාස්වතවාදයයි
(4) කර්මවාදයයි (5) හේතුඵලවාදයයි

06. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වනප්‍රස්ථ හා සන්‍යාසී වශයෙන් ජීවිතය අවස්ථා හතරකට බෙදා තිබුණි. ඒ අනුව වානප්‍රස්ථ අවධියේ දී කළ යුතු වූයේ,
(1) ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමයි
(2) තවුස්දම් රැකීම සඳහා වනගතවීමයි
(3) සංචාරක ජීවිතයක් ගත කිරීමයි
(4) විවාහ වී අඹුදරුවන් පෝෂණය කිරීමයි
(5) අනගාරික යෝගී ජීවිතයක් ගත කිරීමයි

07. බ්‍රාහ්මණ යුගයේදී, මිය ගිය තම ස්වාමි පුරුෂයා වෙනුවෙන් බිරිඳ විසින් කළ යුතු උසස්ම චාරිත්‍රය ලෙස සලකා ඇත්තේ,
(1) ගෘහ ජීවිතය අතහැර වනගත වීමයි
(2) දරුවන්ගේ විවාහ කටයුතු ඉටු කර දීමයි
(3) ''සති පූජාව නමින් හැඳින් වූ ආගමික කාර්යයෙහි යෙදීමයි
(4) ස්වාමියාගේ ඥාතීන්ට සැලකීමයි
(5) අනිත්‍ය මෙනෙහි කරමින් ගෘහ ජීවිතය ගත කිරීමයි

08. ක්‍රිස්තු පූර්ව හයවන සියවස වනවිට භාරතයෙහි විවිධ ශ්‍රමණ ගුරුකුල පැවතියේය. ඒ අතර ශ්වේතාම්බර හා දිගම්බර වශයෙන් කණ්ඩායම් දෙකක් දකිය හැකි වූයේ,
(1) නිගණ්ඨයන් අතරය (2) ජටිලයන් අතරය (3) ආජීවකයන් අතරය
(4) පරිබ්‍රාජකයන් අතරය (5) තාපසවරු අතරය

09. කිසිවකු විසින් නිර්මාණය නොකරන ලද නොඋපදවන ලද නිත්‍ය වූ, අවිපරිණාමී වූ, ස්ථිර පැවැත්මක් ඇති සප්ත පදාර්ථයන් හඳුන්වා දෙමින් ශාස්වතවාදී අදහසක් ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,
(1) පූර්ණ කස්සපය (2) මක්ඛලී ගෝසාලය (3) පකුධ කච්චායනය
(4) සංජයබෙල්ලට්ඨිපුත්තය (5) නිගණ්ඨනාථපුත්තය

10. සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හෝ හේතුප්‍රත්‍යයක් නැතිබවත්, ස්වභාව නියතියකට අනුව සත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදුවන බවත් ප්‍රකාශ කළේ,
(1) ජෛන මහාවීරය (2) පූරණ කස්සපය (3) පකුධ කච්චායනය
(4) මක්ඛලීගෝසාලය (5) අජිතකේස කම්බලිය

11. පුද්ගල පෞරුෂය සංවර්ධනයට හා ස්වාධීන චින්තනයට හානි පමුණුවන පුබ්බේකත හේතුවාදය, අහේතුඅප්‍රත්‍යවාදය දේවනිර්මාණවාදය වැනි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම සඳහා බුදු සමය ඉදිරිපත් කරන්නේ,
(1) හේතුඵලවාදයයි (2) පරිනාමවාදයයි (3) උච්ඡේදවාදයයි
(4) අත්මවාදයයි (5) අනාත්මවාදයයි

12. බුද්ධ කාලීන භාරතයෙහි පැවති සොළොස් මහා ජනපද අතර ගණතන්ත්‍ර පාලනය ක්‍රියාත්මක වූ ජනපද දෙකක් ලෙස හඳුනා ගත හැක්කේ,
(1) අංග හා මගධ රාජ්‍යයයි (2) මගධ හා කෝසල රාජ්‍යයි (3) වජ්ජි හා මල්ල රාජ්‍යයි
(4) වත්ස හා මල්ල රාජ්‍යයයි (5) වජ්ජි හා අවන්ති රාජ්‍යයයි

13. පිණ්ඩෝල භාරද්වාජ හිමියන්ගෙන් බණ අසා බෞද්ධයෙක් වී මහා රාජ්‍යයක් වූ වත්ස රාජ්‍යය බුද්ධ කාලයෙහි පාලනය කළේ,
(1) අජාසත්ත රජුය (2) කොසොල් රජුය (3) බිම්බිසාර රජුය
(4) චණ්ඩප්පජ්ජෝත රජුය (5) උදේන රජුය

14. විවිධ උපක්‍රම යොදා ගනිමින් කුඩා රාජ්‍යයන් තම රාජ්‍යයට ඈඳා ගනිමින් මහා රාජ්‍යයන් ගොඩනැගූ පාලකයන් පිළිබඳව ඉන්දීය ඉතිහාසයේ සඳහන් වේ. ඒ අතර ඉතා ප්‍රකට වූ ප්‍රධාන රාජ්‍ය හතර වූයේ,
(1) මගධ, කෝසල, වත්ස, අවන්ති (2) අංග, මගධ, කාසි, කෝසල (3) වජ්ජි, මල්ල, චේති, වත්ස
(4) මගධ, කෝසල, වජ්ජි, අවන්ති (5) කෝසල, මල්ල, පංචාල, අස්සක

15. බුදුරජාණන් වහන්සේ හා බිම්බිසාර රජු අතර සමීප සබඳතා පැවතියේය. එම රජුගේ ඉල්ලීම පරිදි රාජ භටයන් පැවිදි නොකිරීමටත් අදත්තාදාන පාරාජිකාව පැනවීමටත් තීරණය කළේය. බිම්බිසාර රජු වෙනුවෙන් දේශනා කරන ලද සූත්‍ර දේශනාවකි.
(1) සාමඤ්ඤඵල සූත්‍රය (2) කරණීය මෙත්ත සූත්‍රය (3) වසල සූත්‍රය
(4) තිරෝකුඩ්ඩ සූත්‍රය (5) පරාභව සූත්‍රය

16. කාන්තා සමාජයට සියලු වරප්‍රසාද හිමිකර දීමට බුදුරදුන් ක්‍රියාකර ඇත. ඒ අනුව මාතෘත්වය ඉතා ගෞරවනීයත්වයෙන් සලකන ලද බව වඩාත්ම තහවුරු වන්නේ,
(1) පටාචාරාවට තනතුරු පිරිනැමීමෙනි (2) භික්ෂුණී ශාසනය ඇති කිරීමෙනි (3) යසෝදරා දේවියට දහම් දෙසීමෙනි
(4) නකුල මාතාවගේ චරිතය අගය කිරීමෙනි
(5) මව බ්‍රහ්ම නාමයෙන් හැඳින්වීමෙනි

17. මහා කච්චාන තෙරුන් වහන්සේගෙන් ධර්මය අසා තෙරුවන් සරණ ගිය පාලකයා වන්නේ,
(1) අජාසත්ත රජුය (2) චණ්ඩප්පජ්ජෝත රජුය (3) බිම්බිසාර රජුය
(4) කොසොල් මහා රජුය (5) විඩූඩභ රජුය

18. චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ විසින්ම අවබෝධකරගෙන අන්‍යයින්ට ද අවබෝධකරවන බැවින් බුදුරදුන් තුළ පැවති එම විශේෂ ගුණය
(1) භගවා නම් විය (2) ලෝකවිදූ නම් විය (3) විජ්ජාචරණසම්පන්න නම් විය
(4) බුද්ධ නම් විය (5) සත්ථාදේවමනුස්සානං නම් විය

19. "බුදුරජාණන් වහන්සේ ලෞකික ආසා නැමති ගිනිගත් නිවස තුළ දූවෙන දරුවන් බේරාගැනීමට මාර්ගය යොදන්නා වූත්, බේරා ගැනීමෙන් පසු නිර්වාණය නමැති ආරක්ෂක ස්ථානයට මඟ පෙන්වන්නා වූත් පියකු බඳුය." මෙසේ බුදුරදුන් පිළිබඳව ඇගයීමක් කළේ,
(1) මහාචාර්ය මැක්ස් මුලර් විසිනි (2) මහාචාර්ය සෝණ්ඩර්ස් විසිනි (3) බර්ට්‍රන්ඩ් රසල් විසිනි
(4) එඩ්වින් අර්නෝල්ඩ් විසිනි (5) මහාචාර්ය ලක්ෂ්මී නරසු විසිනි

20. අග තනතුරු පහකින් සම්බුදු සසුන බැබළවීම සඳහා සුදුසුකම් ලැබීමට සමත් වූයේ,
(1) සැරියුත් තෙරුන්ය (2) ආනන්ද තෙරුන්ය (3) මහා කාශ්‍යප තෙරුන්ය
(4) මුගලන් තෙරුන්ය (5) රාහුල තෙරුන්ය

21. රූපාවචර ධ්‍යාන ලබා අනාගාමී තත්ත්වයට පත්ව ධර්ම කථික උපාසකයන් අතර අග්‍ර වූයේ
(1) අනේපිඬු සිටුතුමාය (2) නකුලපිතාය (3) චිත්ත ගෘහපතියාය
(4) යසකුල පුතුගේ පියාය (5) භල්ලුක උපාසකතුමාය

22. "අත්තජ්ඣාසය" දේශනා ක්‍රමය ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) ශ්‍රාවකයාගේ අපේක්ෂාවට අනුව දහම් දේශනා කිරීමයි
(2) තමන් වහන්සේගේ අදහසට අනුව දහම් දේශනා කිරීමයි
(3) අර්ථය පැහැදිලි කිරීම සඳහා දහම් දේශනා කිරීමයි
(4) ප්‍රශ්නයකට පිළිතුරු දීම සඳහා දහම් දේශනා කිරීමයි
(5) ප්‍රති ප්‍රශ්න විමසා දහම් දේශනා කිරීමයි

23. කුමාර කාශ්‍යප මාතාව පිළිබඳව ගැටලුවක් මතු වූ අවස්ථාවේ එය නිරාකරණය කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් පත්කරනු ලැබුවේ,
(1) විශාකා උපාසිකාවයි (2) පටාචාරා තෙරණියයි (3) නකුල මාතාවයි
(4) ධම්මදින්නා තෙරණියයි (5) ඛුජ්ජුත්තරා උපාසිකාවයි

24. සුවිශේෂී වූ පුණ්‍ය කර්ම දහයක් දස පුණ්‍යක්‍රියා ලෙස බුදු දහමෙහි හඳුන්වා දී ඇත. ඒ අතර "අපචායනය" යනුවෙන් අදහස් කරන්නේ,
(1) පින්දීමයි (2) නිවැරදි දක්මයි (3) වතාවත් කිරීමයි
(4) ධර්ම ශ්‍රවණයයි (5) පිදිය යුත්තන් පිදීමයි

25. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය පරිණාමය හා විකාශය හේතු ප්‍රත්‍යාකාරව සිදු වූ බව බෞද්ධ මතයයි. එය පැහැදිලි කර ගැනීම සඳහා යොදා ගත හැකි සූත්‍ර දේශනාව වන්නේ,
(1) අග්ගඤ්ඤ සූත්‍රයයි (2) වසල සූත්‍රයයි (3) පරාභව සූත්‍රයයි
(4) රතන සූත්‍රයයි (5) අම්බට්ඨ සූත්‍රයයි

26. ප්‍රජා සුභ සාධනය ඇති කරමින් ප්‍රජා අවශ්‍යතා සපුරාලමින් රටෙහි සංවර්ධනය ඇති කිරීම පාලකයාගේ වගකීමකි. ඒ සඳහා දසරාජ ධර්මවල ඇතුලත් කර ඇත්තේ,
(1) ඍජු බවයි (2) මෘදු බවයි (3) දානයයි
(4) තපසයි (5) අවිහිංසාවයි

27. පක්ෂීන් සිවුපාවුන් සහිත සියලු ජනතාවට රැකවරණය සලසමින්, අපරාධ මර්දනය කිරීමත් ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමත් පූජනීය විශාරදයන්ගෙන් උපදෙස් ලබා ගැනීමත් ඉහළම ප්‍රතිපත්ති ගරුක පාලකයකුගේ ලක්ෂණයකි. ඒ සියලු අරමුණු ඇතුළත් බෞද්ධ දේශපාලන මූල ධර්මය වන්නේ,
(1) සප්ත අපරිහානි ධර්මයන්ය (2) සතර සංග්‍රහවස්තුවයි (3) දස සක්විති වත්ය
(4) සතර අගතියෙන් වෙන්වීමයි (5) පංචසීල ප්‍රතිපත්තියයි

28. ගමේ සිටි ධනවතා ධනපාල නමින් ම හැඳින්වීය. ඔහු කිසි විටෙක තම රැකියාව වූ වෙළෙඳාමෙන් වංචාවක් කළේ නැත. සාධාරණව ජීවත් වූ ඔහු බිරිඳ සමඟ සමගියෙන් කටයුතු කළේ විවාහ දිවියේ අර්ථවත් බව තේරුම් ගනිමින්ය. කිසිදිනක මත් ද්‍රව්‍ය භාවිතා නොකළ ඔහු බොරුකීම දැඩි සේ පිළිකුල් කළේය. ප්‍රදේශයේ පිහිටුවා ඇති අවිහිංසාවාදී සංගමයේ සභාපතිවරයා වූ ඔහු සියලු දෙනා අතර ජනප්‍රිය විය. මේ අනුව ඔහු,
(1) රටේ නීතිය හොඳින් ආරක්ෂා කරන්නෙකි
(2) නිත්‍ය ශීලය ආරක්ෂා කරන්නෙකි
(3) සත්‍යවාදී තැනැත්තෙකි
(4) අගතිගාමී නොවී කටයුතු කරන්නෙකි
(5) පරහිතකාමී පුද්ගලයෙකි

29. ලෝභ, දෝෂ, මෝහ, චේතනා පූර්වාංගමව සිදුකරන ක්‍රියා අකුසල් යනුවෙන් බුදුදහමේ හඳුන්වයි. එවැනි අකුසල් දහසක් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් අතර ඒවායින් කයින් හා මනසින් සිදුවන අකුසල් සංඛ්‍යාව,
(1) තුනකි (2) හතරකි (3) පහකි
(4) හයකි (5) දහයකි

30. අප කුමන සමාජයක ජීවත් වුවද යමක් කිරීමේ දී එය හොඳද නරකද යන්න තීරණය කිරීම වඩාත් වැදගත් වේ. එහිදී වඩාත් සුදුසු වන්නේ,
(1) පොත පතෙහි සඳහන් කරුණු සලකා බැලීමයි
(2) ගුරුවරුන්ගේ අදහස් අනුව කළයුත්ත තීරණය කිරීමයි
(3) තමන්ටත් අනුන්නටත් උභය පක්ෂයටම යහපතක් වන දේ කිරීමයි
(4) තර්කානුකූලව බලා නිවැරදි දේ කිරීමයි
(5) දෙමාපියන්ගේ අදහස් අනුව නිවැරදි දේ තීරණය කිරීමයි

31. ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා උපදෙස් සපයන බෞද්ධ සූත්‍ර දේශනාවක් වන්නේ,
(1) මහා මංගල සූත්‍රයය (2) පරාභව සූත්‍රයයි (3) අග්ගඤ්ඤ සූත්‍රයයි
(4) සිගාලෝවාද සූත්‍රයයි (5) චක්කවත්ති සීහනාද සූත්‍රයයි

32. බෞද්ධ මූලාශ්‍රවල සඳහන් කරුණු අනුව මිනිසා අපරාධවලට පොළඹවන ප්‍රධානතම හේතුවක් වන්නේ,
(1) දිළිඳුකමයි (2) මත්ද්‍රව්‍ය භාවිතයයි (3) තරගකාරී බවයි
(4) තෘෂ්ණාවයි (5) චිත්තාවේගයයි

33. රියසකට කඩඇණය මෙන් සමාජයේ යහපැවැත්මට උපයෝගී වන කරුණු හතරක් සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වෙයි. රාජ්‍ය පාලකයකු තුළද පැවතිය යුතු වූ මෙම කරුණු හතර නම්,
(1) සතර සතිපට්ඨානයයි (2) සතර සංග්‍රහ වස්තුවයි (3) සතර බ්‍රහ්ම විහරණයයි
(4) සතර ඉරියව්වයි (5) සතර අගතියයි

34. කායිකවත් වාචසිකවත්, මානසිකවත් කුසල්අකුසල් සිදුකිරීමට පුද්ගලයා යොමුවන බව බෞද්ධ මතයයි. ඒ අනුව යමෙක් ව්‍යාපාදයෙන් වෙන්වන්නේ නම් එය,
(1) කායික කුසලයකි (2) මානසික කුසලයකි (3) වාචසික කුසලයකි
(4) කායික හා වාචසික කුසලයකි (5) මානසික හා වාචසික කුසලයකි

35. අටලෝ දහමින් කම්පා නොවූ බුදුරජාණන් වහන්සේ පරමා දර්ශී වෙමින් තම ශ්‍රාවකයන්ටද එසේ කටයුතු කිරීමට උපදෙස් දුන්හ. එම සුවිශේෂී ගුණය හඳුන්වන්නේ,
(1) යථාවාදී තථාකාරී ගුණය නමිනි (2) ලෝක විදූ ගුණය නමිනි (3) තාදී ගුණය නමිනි
(4) සල්ලේඛ ප්‍රතිපදාව ලෙසිනි (5) සම්මා සම්බුද්ධ නමිනි

36. "භගවත්නි මහණ ගොයුම්හු වූ කලී විශිෂ්ට රූප සම්පත් ඇත්තෝය. දකුම් කටයුතුහ. ප්‍රසාද ජනකය. උතුම් වර්ණ සෞන්දර්යයෙන් සමන්විතහ. බඹහුසේ උතුම් රන් පැහැ ඇත්තෝය. උත්තම ශරීර ප්‍රභා ඇත්තෝය. සිය සිරුරෙහි දක්මට නොමඳ වූ අවකාශ ඇත්තෝය" මෙසේ බුදුරජාණන් වහන්සේ වර්ණනාවට ලක් කළේ
(1) සෝණදණ්ඩ බමුණා විසිනි (2) අස්සලායන බ්‍රාහ්මණයා විසිනි (3) පොට්ඨපාද පිරිවැජියා විසිනි
(4) සකුළුදායී පිරිවැජියා විසිනි (5) අභය රාජ කුමාරයා විසිනි

37. "මහිච්ඡතාවය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ,
(1) අඩු බලාපොරොත්තු ඇති බවයි
(2) වැඩි බලාපොරොත්තු ඇති බවයි
(3) බලාපොරොත්තු කිසිවක් නැති බවයි
(4) ලද දෙයින් සතුටු වන බවයි
(5) නැති ගුණ පෙන්වීමයි

38. පුද්ගල හා සමාජ සුරක්ෂිතතාවය අගය කරන බුදු දහම නිරෝගී පුද්ගලයකු බිහි කිරීමටත්, ධන සම්පත් සුරක්ෂිත කිරීමටත් මත් ද්‍රව්‍ය භාවිතයෙන් වෙන්වීමේ වැදගත්කමත් අවධාරණය කරයි. ඒ අනුව මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන අයහපත් ප්‍රතිඵල හයට අයත් නොවන්නේ,
(1) නුවණ දුර්වල වීමයි (2) ඇස් ඉදිරිපිට ධනය විනාශ වීමයි (3) රෝගාබාධ ඇතිවීමයි
(4) අපකීර්තිය පැතිරීමයි (5) අභිධ්‍යාව වර්ධනය වීමයි

39. "ආනන්දය විශාලාව රමණීයය. සත්තම්බක චෛතිය රමණීයය. බහු පුත්තක චෛතිය රමණීයය. සාරන්දද චෛතිය රමණීයය. චාපාල චෛතිය රමණීයය" යනුවෙන් බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට වදාළ බව මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වේ. එයින් ගම්‍ය වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේ විශාලාවෙහි වැඩ සිටි බවයි
(2) භාරතයෙහි බොහෝ චෛත්‍ය තිබූ බවයි
(3) බුදුරජාණන් වහන්සේ සෞන්දර්යය අත්විඳි බවයි
(4) බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් සමග මිත්‍රශීලී වූ බවයි
(5) බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට බොහෝ උපදෙස් දුන් බවයි

40. බුදුරජාණන් වහන්සේ සෞන්දර්යය අත්විඳි බවට නිදසුන් ලෙස ගත හැකි සූත්‍ර දේශනාවකි.
(1) අරිය පර්යේෂණ සූත්‍රය (2) සාමඤ්ඤඵල සූත්‍රය (3) අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය
(4) දම්සක් පැවතුම් සූත්‍රය (5) ව්‍යග්ඝ පජ්ජ සූත්‍රය

4329

41. අන්‍යෝන්‍ය සබඳතා මගින් යුතුකම් ඉටුකිරීම සඳහා සදිසා සමාජ ක්‍රමය හඳුන්වා දෙන බුදු දහම එම යුතුකම් ඉටු කිරීමට පෙරාතුව පුද්ගලයකු විසින් වැළකිය යුතු දුසිරිත් පිළිබඳව සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් කරයි. එහි ඇති දුසිරිත් ගණන,

(1) හතරකි
(2) අටකි
(3) දහයකි
(4) දහතුනකි
(5) දහඅටකි

42. දීඝජාණු කෝලිය පුත්‍රයාගේ ඉල්ලීම පරිදි මෙලොව හා පරලොව දියුණුව සඳහා හේතුවන කරුණු ඇතුළත් කරමින් දේශනා කළේ ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයයි. එහි සඳහන් මෙලොව දියුණුව සඳහා හේතුවන කරුණු,

(1) හතරකි
(2) අටකි
(3) දොළහකි
(4) දහසයකි
(5) හයකි

43. බුදු දහමින් උපදෙස් දෙන්නේ දැහැමි රැකියා තුළින් ධනය ඉපයීමටයි. එම අනුමත රැකියා අතරට අයත් නොවන්නකි.

(1) කෘෂිකර්මාන්තය
(2) ගව පාලනය
(3) රාජ්‍ය සේවය
(4) විවිධ කර්මාන්තයන්හි යෙදීම
(5) සත්ත්ව වෙළඳාම

44. "ධනය පරිහරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු බොහෝ බෞද්ධ සූත්‍ර වලදී සටහන් කර ඇත. ඒ අතර "දැහැමින් ධනය ඉපයීම, තමා සැපවත් වීම, පරිත්‍යාග කිරීම, ගිජුකමින් තොරව ධනය පරිහරණය කිරීම යන කරුණු හතර අවධාරණය කර ඇත්තේ,

(1) පත්තකම්ම සූත්‍රයේය
(2) ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයේය
(3) රාසිය ගාමිණී සූත්‍රයේය
(4) සිගාලෝවාද සූත්‍රයේය
(5) අණන සූත්‍රයේය

45. ගිහියා ලැබිය යුතු සැප පිළිබඳව අංගුත්තර නිකායේ අණන සූත්‍රයේ සඳහන් කරයි. එහි දක්වෙන පරිදි "භෝග සුඛය" පැහැදිලි කිරීමට වඩාත් යෝග්‍ය ප්‍රකාශය වන්නේ,

(1) සාධාරණව උපයාගත් භෝග සම්පත් ඇතැයි ලබන සතුටයි
(2) දැහැමින් ලබන ලද සම්පත් පරිභෝජනයෙන් ලබන සැපයයි
(3) කිසිවකුට ණය නැතිව උපයාගත් භෝග සම්පත් ඇතිව ලබන සැපයයි
(4) කයින් වචනයෙන් මනසින් වැරදි නොකර ජීවත්වීමෙන් ලබන සැපයයි
(5) ණය ඇතිව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සැපයයි

46. ධන සම්පත් කළමනාකරණයේදී තමා උපයන ලද ධනය, කොටස් හතරකට බෙදා පරිභෝජනය ආයෝජනය ඉතිරි කිරීම පිළිබඳව වටිනා ධර්මෝපදේශයක් දක්වා ඇති සූත්‍ර දේශනාව වන්නේ

(1) පත්තකම්ම සූත්‍රය
(2) ධම්මික සූත්‍රය
(3) වණිජ්ජා සූත්‍රය
(4) සිගාලෝවාද සූත්‍රය
(5) චක්කවත්තී සීහ නාද සූත්‍රය

47. ධන සම්පත් විනාශ වීම සඳහා මිත්‍ර ප්‍රති රූපකයන් ඇසුරද බලපාන බව බෞද්ධ මූලාශ්‍රවල සඳහන් වේ. එහි සඳහන් මිත්‍ර ප්‍රතිරූපකයන් සිව්දෙනෙකි. එයට අයත් නොවන්නේ,

(1) අඤ්ඤදත්ථු හර
(2) අත්ථක්ඛායි
(3) වචී පරම
(4) අනුප්පිය භානි
(5) අපායසහාය

48. උට්ඨාන වීර්යයෙන් දහඩිය මහන්සියෙන් ධනය ඉපයීමේ වැදගත්කම අවධාරණය කර ඇත්තේ,

(1) සිගාලෝවාද සූත්‍රයේය
(2) මහා මංගල සූත්‍රයේය
(3) කලාම සූත්‍රයේය
(4) අණන සූත්‍රයේය
(5) පත්තකම්ම සූත්‍රයේය

49. ධන විසර්ජනය පිළිබඳව බුදු දහමේ ඇතුළත් විග්‍රහයන් අධ්‍යයනය කිරීමේදී පංචබලි වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමට ද මග පෙන්වයි. ඒ අනුව "අතිථිබලි" යනුවෙන් අර්ථවත් වන්නේ,

(1) ඥාතීන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමයි
(2) ආගන්තුකයන් සඳහා යුතුකම් ඉටු කිරීමයි
(3) මියගිය ඥාතීන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමයි
(4) දෙවි දේවතාවන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමයි
(5) රජයට බදු ගෙවීමයි

50. පරිසර සංරක්ෂණය පිළිබඳව බුදුරජාණන් වහන්සේ ගිහි පැවිදි දෙපක්ෂයේම අවධානය යොමුකර ඇත. විනය ශික්ෂාවන්හි මෙන් ම සේඛියාවල ද පරිසර සංරක්ෂණයට අදාල කරුණු ඇතුළත් කර ඇත. භික්ෂූන් වෙනුවෙන් දේශනා කළ සේඛියා ප්‍රමාණය,

(1) එකසිය විස්සකි
(2) එකසිය විසි හතකි
(3) දෙසිය විස්සකි
(4) දෙසිය විසි හතකි
(5) හැත්තෑපහකි

4338

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 ජූලි, 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July**

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**
**Buddhist Civilization - II**

**45 S II**

කාලය: පැය තුනකි
**03 hours**

උපදෙස්:
- I කොටසින් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 20යි. (1),(2),(3),ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 4 බැගින් ද, (4), (5), (6), (7), (8) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගින්ද හිමිවේ.

## I කොටස

(01) (i) බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව භාරතීය සමාජයෙහි වෛශ්‍ය වර්ණයට හිමි වූ ස්ව ධර්ම නිවැරදිව දක්වන්න.

(ii) "උපනයනය" යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(iii) ආපද්ධර්ම සැකෙවින් හඳුන්වන්න.

(iv) මක්ඛලී ගෝසාල ශාස්තෘවරයාගේ ඉගැන්වීම් සැකෙවින් ගෙන හැර දක්වන්න.

(v) "අරහං" බුදු ගුණය හඳුන්වන්න.

(02) (i) සිවුබඹ විහරණ සමාජ සංවර්ධනයට ඉවහල් වන ආකාරය පහදන්න.

(ii) "සමජීවිකතාව" පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගල සංවර්ධනය පිණිස ඉවහල්වන ආකාරය පෙන්වා දෙන්න.

(iii) සිගාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය සේවක යුතුකම් ගෙනහැර දක්වන්න.

(iv) සතර සංග්‍රහ වස්තු දේශපාලන මූලධර්මයක් ලෙස අනුගමනය කළ හැකි අයුරු දක්වන්න.

(v) ආදර්ශවත් චරිතයක් ලෙස "විශාඛා මහෝපාසිකාව" අගය කරන්න.

(03) (i) බ්‍රාහ්මණ පූජක පන්තිය තුළ දැකිය හැකි වූ විශේෂ ලක්ෂණ හඳුන්වා දෙන්න.

(ii) බුදුරදුන් තුළ පැවති ආදර්ශවත් නායකත්වය නිදසුන් තුනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(iii) බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහා කරුණා ගුණය සනිදර්ශිතව පහදන්න.

(iv) භෝග විනාශ මුඛ කවරේදැයි මූලාශ්‍රය ඇසුරින් හඳුන්වා දෙන්න.

(v) සමාජ ප්‍රශ්න මෙන්ම පුද්ගල පරිහානිය පාලනය කර ගැනීම සඳහා අල්පේච්ඡතාවය කෙසේ ඉවහල් කර ගත හැකි දැයි දක්වන්න.

## II කොටස

(04) (i) රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ මතය ප්‍රජාතන්ත්‍රවාදී හා ජනහිතකාමී ලක්ෂණවලින් යුක්තවන්නේ කෙසේදැයි පිරික්සන්න.

(ii) බ්‍රාහ්මණ වර්ණ ධර්ම සංකල්පය බුදු දහමින් ප්‍රතික්ෂේප කරන ආකාරය සාධක තුනක් ඔස්සේ පැහැදිලි කරන්න.

(05) (i) ක්‍රිස්තු පූර්ව හයවන සියවසෙහි භාරතීය සමාජය තුළ පැවති ශ්‍රමණ ගුරුකුල පිළිබඳ විමසීමක් කරන්න.

(ii) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය තුළ පැවති සුවිශේෂතා පිරික්සන්න.

(06) (i) බුද්ධකාලීන භාරතීය සමාජයෙහි කෘෂි ආර්ථික ජීවන රටාවක් පැවති බවට සාධක ඉදිරිපත් කරන්න.

(ii) ක්‍රිස්තු පූර්ව හය වන සියවස වන විට භාරතීය සමාජය නාගරීකරණයට ලක්වූයේ දැයි විමර්ශනය කරන්න.

(07) (i) යහපාලනය සඳහා දසරාජ ධර්මවල උපයෝගීතාවය විමර්ශනය කරන්න.

(ii) කූටදන්ත සූත්‍රාගත දේශපාලන මූලධර්ම අනුව රාජ්‍ය පාලකයා කෙබඳු අයෙක් විය යුතු දැයි සාකච්ඡා කරන්න.

(08) (i) දැහැමි ධනෝපායනයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි බෞද්ධ මූලාශ්‍ර ඇසුරින් පරීක්ෂා කරන්න.

(ii) බෞද්ධ මූලාශ්‍රවලට අනුව ධනවිසර්ජනය කෙසේ සිදුවිය යුතුදැයි සාකච්ඡා කරන්න.